# බෝධිසත්ත්ව චරණය සහ ලෝක පිතෘ සංකල්පය

ඇත්කඳුරේ සුමනසාර හිමි

Buddhism calls itself a "non-theistic" religion. The historical Buddha taught that believing in and worshipping gods was not useful for those seeking to realize enlightenment. Due to this, many Buddhists consider themselves to be atheists. Yet Buddhist art and literature are richly stocked with god-like beings, many of which are known as bodhisattvas. This is especially true of Mahayana Buddhism. Mahayana temples are populated by statues and paintings of many characters and creatures, some beautiful, some demonic. After buddhas, the most important beings in Mahayana iconography are bodhisattvas. The word *bodhisattva* means "enlightenment being." Very simply, bodhisattvas are beings who work for the enlightenment of all beings, not just themselves. They vow not to enter Nirvana until all beings enter Nirvana together.The bodhisattva is the ideal of all Mahayana Buddhists. The bodhisattva's path is for all of us, not just the beings in the statues and pictures. Mahayana Buddhists take Bodhisattva Vows to save all beings.

මහායාන දර්ශනයේ දී බෝධිසත්ත්ව සංකල්පය සර්වේශ්වර පෞරුෂයකින් විචිත්‍රණය කොට තිබෙනු දක්නට ලැබේ. බෝධිසත්ත්වයන්ගේ උපතේ සිට පැවතුණු ක්‍රියාකලාපයන්, ලාලිත්‍ය ලීලාවන් සියල්ල අපූර්වත්වයකින් හුවා දක්වනු ලැබේ. රීස් ඩේවිස් මහතා බෝධිසත්ත්ව යනුවෙන් අරුත් ගන්වන්නේ බුද්ධත්වය ලබා ගැනීමට අරමුණු කරගත් තැනැත්තා යන අදහසිනි. එමෙන් ම මොනියර් විලියම් මහතා පෙන්වා දෙන්නේ සම්පූර්ණ වූ ඥානය හෙවත් බෝධිය සාරය කොට ඇති පුද්ගලයා බෝධිසත්ත්ව නම් වන බවයි. මේ අනුව බුදු බව පතා දීර්ඝ කාලීන ආධ්‍යාත්මික චරණයක යෙදුණු පුද්ගලයකු බෝධිසත්ත්ව යන වචනයෙන් හැඳින්වෙන බව පෙනේ. මහායානයෙහි මෙන් ම ථේරවාදයෙහි ද බෝධිසත්ත්ව වරුන්ට සුවිශේෂී තැනක් හිමි

වේ. එනමුදු ථේරවාදයට වඩා අධීශ්වර පිතෘත්වයකින් මහායානයේ දී බෝසත්වරුන් නිරූපණය වන අයුරු දක්නට ලැබේ. ශාක්‍යමුනි මහා මුනිවර බෝසත්හු සියලු දිශා ඒකාලෝක කරති, යන අදහසින් බෝසත් සංකල්පය අතිමානුෂීය තත්ත්වයට යොමුකර ඇති ස්වභාවයක් මහායානයේ දී දක්නට ලැබේ. එකී තත්ත්වයේ උච්චතම අවස්ථාව ලෙස පැහැදිලි වන්නේ ප්‍රධාන බෝධි සත්ත්වයන් 08 දෙනෙකු තෝරා ගැනීම ය. මොවුහු 'ධ්‍යානබෝධිසත්ත්ව, මහාස්ථාන ප්‍රාප්තිත්‍රෛලෝක්‍ය විජයී' යනුවෙන් හැඳින් වෙති.

- ★ අවලෝකිතේශ්වර
- ★ ආකාශගර්භ
- ★ වජ්‍රගර්භ
- ★ ක්ෂිති ගර්භ
- ★ සර්වනිවාරණ
- ★ විෂ්කම්භි
- ★ මෛත්‍රෙය නාථ
- ★ සමන්තභද්‍ර
- ★ මඤ්ජු ශ්‍රී

එම බෝසත්වරුන් පිළිබඳ තිබූ ආකල්පය සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ දී වැඩි දියුණු ස්වරූපයකින් හඳුනා ගත හැකි ය. බුදුරජාණන් වහන්සේ මහාසෘද්ධි ප්‍රාතිහාර්ය පෙන්වමින් බොහෝ මහසත්වරුන්ට අවුරුදු අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරුදු පුහුණු කළ පෙරුම් පුරා අවබෝධ කරගත් සම්‍යක් සම්බෝධිය බෝසතුන්ට පැවරූ බව සද්ධර්මපුණ්ඩරීකයේ 22 පරිච්ඡේදයේ දී විස්තර වේ "**ගණන් කළ නොහැකි සියදහස් මිලියන අසංඛ්‍යයක් කල්ප ගණන් පෙරුම්පුරා දුෂ්කරව පුරුදු පුහුණු කළ අනුත්තර සම්‍යක් සම්බෝධිය මම දැන් ඔබට පවරමි. ඔබ එක ම මනසකින් මෙම ධර්මය ලොව දේශනා කළ යුතු ය. එහි ප්‍රතිඵල ලැබීමට සෑම තැන ම පැතිර විය යුතු ය**"(සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 22 පරි).

තදුක්ත විස්තරයට අනුව බෝසතුන්ගේ කාර්ය භාරය ද සම්‍යග් සම්බෝධි ඥානය ලබාගැනීම සඳහා සත්ත්වයන්ට ඉඩ ප්‍රස්තාව සලසා දීම බව ප්‍රකට වේ. මෙකී කාර්ය ඉටුකිරීමේ දී බෝසත්වරුන් නිරූපණය වන්නේ ලෝක පිතෘවරු වශයෙන් බව ප්‍රඥායමාන ය.

## මෛත්‍රෙය බෝසත්වරයාණෝ

| | | |
|---|---|---|
| මුද්‍රාව | - | ධර්මචක්‍ර, වර, විතර්ක |
| සංකේතය | - | පූර්ණඝටය සහ චක්‍රය |
| වර්ණය | - | කහ පැහැය |

| | | |
|---|---|---|
| විශේෂ සටහන | - | හිසමත පැලඳි ස්තූපය |
| ධ්‍යානී බුද්ධ | - | අමෝඝසිද්ධි |
| ධ්‍යානී බෝධිසත්ත්ව | - | විශ්වපානී |
| මානුෂී බුද්ධ | - | මෛත්‍රේය |

සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයට අනුව මෛත්‍රෙයනාථ බෝසතුන් තව්තිසා දෙව්ලොව වැඩ වසන බව පැවසේ. එමෙන් ම මෛත්‍රෙයනාථ බෝසතාණෝ දෙතිස් මහාපුරිස ලකුණින් යුක්ත වන අතර නොයෙක් මහාසත් බෝසත්වරු වටකරගෙන සිටිති. එමෙන් ම එම බෝසතුන්ට සිය දහස් දස දහස් දසලක්ෂ ගණනින් දිව්‍යාංගනාවන් උපස්ථාන කරන බව ද පැහැදිලි කෙරේ. ශක්‍යමුනි බුදුරජාණන් වහන්සේගෙන් පසුව බුද්ධත්වයට පැමිණෙන්නේ මේ මෛත්‍රෙයනාථ බෝසතාණෝ ය. මෙතුමාගේ බුදුවීම දක්වා ඇති කාලය කොටස් තුනකට බෙදේ.

- ★ **ධර්මචක්‍ර සමය- බුද්ධ පරිණිර්වාණයේ සිට අවුː 500 දක්වා.**
- ★ **සද්ධර්මප්‍රතිරූපක සමය - එතැන් සිට අවු 1500 දක්වා.**
- ★ **ධර්මචක්‍ර සමය - එතැන් සිට අවු 300 දක්වා.**

මහායාන සූත්‍රයන්හී දී මෛත්‍රෙයනාථ බෝසතුන්ගේ ලෝක පිතෘත්වය අඩු වැඩි වශයෙන් නිරූපණය වන අවස්ථා දක්නට ලැබේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මෙකී බෝසතුන්ව භික්ෂූන්ට හඳුන්වා දෙන්නේ මෙසේ ය. **''බුදුරජාණන් වහන්සේගේ ගැඹුරු ධර්මය විශිෂ්ට සේ විදහා දැක්විය හැකි අන් අයකු තථාගතයාණෝ හැරුනවිට සිටීනම්, ඒ මේ මෛත්‍රෙයනාථ පමණකි''**

මෙය ලෝක පිතෘ වශයෙන් මෛත්‍රෙයනාථ බෝසතුන් හැඳින් වූ හොඳම ප්‍රකාශයක් ලෙස හඳුනා ගැනීම වැදගත් ය. බුදුරජාණන් වහන්සේගෙන් පසුව ලොව සිටින සුවිශේෂී ම පුද්ගලයා ලෙස මෛත්‍රෙයනාථ බෝසතුන් හඳුන්වා තිබීම, ලෝක පිතෘත්වයක් මෙම බෝසතුන්ට ආරෝපණය වූ බවට කදිම සාධකයකි. මෛත්‍රෙයනාථ බෝසතාණන් වහන්සේ මහායානයේ දී පිළිගැනෙන්නේ ධර්ම දේශකයකු වශයෙනි. එහි දී ගැඹුරු ධර්මය විග්‍රහ කරන හා තෝරා දෙන විශිෂ්ට ධර්මඥානයක් ඇත්තකු සේ නිරූපණය වේ. සෙසු බෝසතුන් තරමට ම පිතෘත්වයක් මෛත්‍රෙයනාථ බෝසත් වරයාණන්ගෙන් හඳුනාගත නොහැකි ය. මෙකී කාරණය ශාලිස්තම්භ සූත්‍රයේ දී මනාව පැහැදිලි වේ **''ආයුෂ්මාන් ශාරිපුත්‍රෝ මෛත්‍රෙයං බොධිසත්වං මහාසත්වමේතදවෝචත් - අධ්‍යාත්‍ර ශාලිස්තම්බවලෝක්‍ය මෛත්‍රෙය භගවතා භික්ෂුභ්‍යඃ සුත්‍රමිදමුක්තම්. යෝ භික්ෂවඃ ප්‍රතිත්‍යසමුත්පාදං පශ්‍යති, ස ධර්මංපශ්‍යති........ අථ මෛත්‍රෙය සුගතෝක්තසූත්‍රාත්තසස්‍ය අර්ථඃ කථමඃ? ප්‍රතිත්‍යසමුත්පාදඃ කථමඃ? බුද්ධඃ කථමඃ කථං ප්‍රතිත්‍ය සමුත්පාදං පශ්‍යන් ධර්මං පශ්‍යති ? කථං ධර්මං පශ්‍යන් බුද්ධං පශ්‍යති ?''** (ශාලිස්තම්භ සූත්‍රය, මහායාන සූත්‍ර සංග්‍රහය, I, 100 පිටුව) යනුවෙන් දැක්වෙන පරිදි ශාරීපුත්‍ර හිමි මෛත්‍රෙයනාථයන් වහන්සේගෙන් අසන්නේ ගැඹුරු ධර්ම කාරණයක් පිළිබඳව ය.

යමෙක් ප්‍රතීත්‍ය සමුත්පාදය දකී ද, හෙතෙම ධර්මය දකින බවත්, යමෙක් ධර්මය දකී ද, හෙතෙම බුදුන් දකින්නේ ය යන බුද්ධ දේශිතයේ අර්ථය පැහැදිලි කරන ලෙස බෝසතුන්ට ආයාචනය කරයි.

එකී ප්‍රතීත්‍ය සමුත්පාදය යනු කුමක් ද? බුද්ධත්වය කුමක් ද? කෙසේ ප්‍රතීත්‍ය සමුත්පාදය දැක ධර්මය දකී ද?, කෙසේ ධර්මය දැක බුදුන් දකින්නේ ද? ආදි ප්‍රශ්න ගණනාවක් ම අසන්නේ මෛත්‍රෙයනාථ බෝසතුන්ගෙනි. මේ අනුව සියලුම ප්‍රශ්නවලට මනාව පිළිතුරු දෙන ආකාරය ඉහත සූත්‍රයෙන් පිළිබිඹු වේ. ''**ඒවමුක්තො මෛත්‍රෙයො බෝධිසත්වෝ මහාසත්වඃආයුෂ්මන්තං ශාරද්වතිපුත්‍රමෙතදවොචත්**" (ශාලිස්තම්භ සූත්‍රය, මහායාන සූත්‍ර සංග්‍රහය, I කොටස, 101 පිටුව) යනුවෙන් කරන පිළිතුරු දීමෙන් මෛත්‍රෙයනාථ බෝසතුන් සතු අසම සම ධර්මඥානය මනාව ප්‍රකට වේ. එමෙන් ම මෛත්‍රෙයනාථ බෝධිසත්වයන් වර්තමානයේ පමණක් නොව අතීත, අනාගත බුදුවරුන්ගේ ධර්මය ද මැනවින් දේශනා කරන්නට සමතෙක් ලෙස බුදුරජාණන් වහන්සේ ම සඳහන් කරති. එමෙන් ම ඒ හැමවිට ම බෝසතුන් සියලු ධර්ම කථිකයන් අභිභවා අග්‍රගණ්‍යය කෙනකු වන බව ද බුද්ධ කාර්ය මනාව ඉටුකරන පුද්ගලයෙක් ලෙස ද අර්ථගන්වනු පෙනේ "..... **සර්වත්‍ර ච බුද්ධකෘතෙ‍්‍යන සත්ත්වානං ච පරිපාකායාභියක්තො'භූත්......**" මෙම විස්තරයෙන් පැහැදිලි වන්නේ සර්වව්‍යාපි බවක් බෝසතුන්ගේ චරිතයෙන් ප්‍රකට වන බව ය. එපමණක් ද නොව බුදුරජාණන් වහන්සේගේ ධර්මය සත්ත්වයාට මනාව කියා දිය හැකි සත්ත්වයන්ගේ පියකු වශයෙන් ද මෛත්‍රෙයනාථ බෝධිසත්වයන්ව නිරූපණය වන අයුරු පෙනේ.

## සමන්තභද්‍ර බෝසත් වරයාණෝ

| | | |
|---|---|---|
| මුද්‍රාව | - | විතර්ක සහ වරද |
| සංකේතය | - | චින්තාමණී සහ උත්පලය |
| වර්ණය | - | පලාවන් පැහැය සහ කහ පැහැය |
| වාහනය | - | හස්තියා |
| ධ්‍යානී බුද්ධ | - | වෛරෝචන |

මෙතුමා ධ්‍යානි බෝසත්වරයකු වශයෙන් මහායානයේ දී හැඳින් වේ. හිස මත ඔටුන්නක් ද ශරීරයේ බොහෝ ආභරණ ද පලඳියි. වම් අතින් චිත්තාමණික්‍යයක් හෝ නීලෝත්පලයක් දරන අතර දකුණු අතේ විතර්ක මුද්‍රාව ඇති බව විස්තර වේ. මහායානයේ දී මෙතුමාට අංගසම්පූර්ණ ලෝක පිතෘත්වයක් ආරෝපණය නොකෙරෙන අතර යම් යම් තැන්වල දී පමණක් ලෝක පීතෘවරයකුගේ ලක්‍ෂණ මදින් මද මතුවීම දක්නට ලැබේ. සමන්තභද්‍ර බෝසත්වරයාණන් ද ගණින් කළ නොහැකි විස්තර කළ නොහැකි මහාබෝසත් පිරිසක් පිරිවරාගෙන සිටින බව සඳහන් ය "**අථ බලු සමන්තභද්‍රෙ බෝධිසත්වෝ මහාසත්ත්ව පූර්වස්‍යාංදිශි ගණනාසමතික්‍රාන්තෛ බෝධිසත්වෛඃ සාර්ධපරිවෘතඃ පුරස්කෘතඃ පුකම්පද්භිඃ ක්‍ෂේත්‍රෛ පුවර්ෂද්භිඃ පද්මෛඃ ප්‍රමාද්‍ය මානෛසතූර්ය කෝටිනයුතශතසහස්‍රෛඃ මහතා බෝධිසත්ත්වානුභාවෙන**

**මහත්‍යා බෝධිසත්ත්වවික්‍රර්වයා මහත්‍යා බෝධිසත්ත්වචර්යා මහතා බෝධිසත්ත්වමහාත්මයේන මහතා බෝධිසත්ත්ව සමාහිතේන මහාතා බෝධිසත්ත්ව තේජසා ජාජ්වල්‍යමානේන....**"(සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 19 පිටුව).

මෙලෙසින් විස්තර වන පරිදි මොහු මහපිරිසක් පිරිවරාගෙන නැගෙනහිර දිශාවෙන් පැමිණි බව දැක් වේ. එමෙන් ම පසුකරන සෑම ලෝක ධාතුවක් ම කම්පනය වූ අතර මැණික් වර්ෂා වසින්නට ද විය. අසීමිත වූ තූර්ය භාණ්ඩ වාදනයන් ද වාදනය වූ බව සඳහන් ය. මෙසේ අතිශයෝක්ති වර්ණනයගෙන් ඉස්මතු කරලන්නේ ලෝක පිතෘත්වය යැ'යි හඳුනාගත හැකි ය. එමෙන් ම සමන්තභද්‍ර බෝසත්වරයාණන් වටකරගෙන සිටින්නේ මිනිසුන් (Human), නොමිනිසුන් (Non humans), දිව්‍ය පුත්‍රයන් (Devas), මකරුන් (Dragons), යක්ෂයන් (Yaksas), ගාන්ධර්වයන් (Gandarvas), කින්නරයන් (Kinnaras), අසුරයන් (Asuras), ගරුඬයන් (Garudas), මහා උරගයන් (Mahauragas) ආදි සත්ත්වයන් ය. මෙයින් ගම්‍යමාන සුවිශේෂ කරුණ වන්නේ සියලු සත්ත්වයන් වටකරගෙන සියල්ලන්ගේ ම පියා ලෙස සමන්තභද්‍ර බෝසතුන් වහන්සේ වැඩ සිටිනා බව ය. මෙකී සර්වේශ්වරත්වය සියලු ම ප්‍රධාන බෝධිසත්ත්වයන් වෙත ආරෝපිත වූ පොදු ලක්ෂණයකි. එමෙන් ම සමන්තභද්‍ර බෝසතුන් බුදුරජාණන් වහන්සේට පවසන්නේ තමන් සද්ධර්ම පුණ්ඩරීකය දරන අය ආරක්ෂා කරන බව ය.

උක්ත විස්තරයට අනුව සද්ධර්මපුණ්ඩරික සූත්‍රය දරන පුද්ගලයෙක් වේ නම් ඔහුව උපද්‍රවවලින් මුදාගැනීම සමන්තභද්‍ර බෝසතුන්ගේ කාර්යය වේ. එමෙන් ම මාර යක්ෂ, කුම්භාණ්ඩ, පිසාචාදී කිසිම සත්ත්වයකු විසින් ඔහුට හිරිහැර කිරීමට නොදී ආරක්ෂා කිරීම ද එතුමාගේ කාර්යයකි. මෙකී සියලු ම කරුණුවලින් පිළිබිඹු වන්නේ සමන්තභද්‍ර බෝසතුන් සත්ත්වයාගේ ලෝක පිතෘවරයෙක් වශයෙන් හඳුනාගත හැකි බවයි. සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය අනුගමනය කරන, දරන, පිළිපදින, අසන සර්වාකාර සත්ත්ව කොට්ඨාසයන් මනාව ආරක්ෂා කරමින් සම්‍යඥානය ලබාදීම සමන්තභද්‍ර බෝසතුන්ගේ කාර්යභාරය බව මෙම සූත්‍රයේ දී පැහැදිලි කෙරේ. එමෙන් ම පියකු මෙන් සත්ත්වයාගේ දුක නිමා කොට සතුට සලසා දී ම ද එතුමාගේ එක ම අරමුණ වූ බව පෙනේ "**............මම ඔවුන්ට උපදෙස් දෙමින් කුසල් ඵලයන්හි සතුට ගෙනදෙමි. මම ඔවුන්ට ධාරණය ලබාදෙමි............**(Bukkyo Dendo Kyokai, 2008, P.321) යන්නෙන් ප්‍රකාශ වන්නේ සර්වේශ්වර ස්වරූපයකින් සමන්තභද්‍ර බෝසතුන් විසින් සත්ත්වයන් ආරක්ෂා කරන බව ය "**අදණ්ඩේ දණ්ඩපති දණ්ඩා වර්තනි දණ්ඩ කුශලේ දණ්ඩු සුධාරි සුධාරපති බුද්ධපශ්‍යනෙ සර්වධාරණී ආවර්තනි සංඝපරික්ෂිතෙ සංඝනිර්ඝාතනි සර්ව සත්වරුතකෞශල්‍යානුගතෙ සිංහවික්‍රීඩිතෙ අනුවර්තෙ වර්තනි වර්තාලි ස්වාහා**" (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 26 පරි). සමන්තභද්‍ර බෝසතුන් තථාගතයන් වහන්සේ ඉදිරියේ තමන් ගැන කරන මෙකී ප්‍රකාශය, ලෝක පිතෘවරයකුගේ ස්වරූපය ප්‍රකට කරන්නක් ලෙස හඳුනාගත හැකි ය.

එපමණක් ද නොව බෝසතුන් විසින් ප්‍රකාශ කෙරෙනුයේ යම්කිසි බෝධිසත්ත්වයකුට මේ ධාරණී පද ඇසීමට ලැබෙන්නේ නම් එයට හේතුව සමන්තභද්‍ර

බෝසතුන්ගේ ලෝකෝත්තර බලය යැයි ඔහු හඳුනාගත යුතු බව ය. සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය ජම්බුද්වීපය පුරා දේශනා කරමි. එම සූත්‍රය යම් පුද්ගලයකු විසින් පිළිගනු ලබන්නේ ද ඔවුන් විසින් තම හඬ ගැන මෙසේ සිතිය යුතුයි. එනම් මේ සියල්ල සිදුවන්නේ සමන්තභද්‍ර බෝසතුන්ගේ සෘධිප්‍රාතිහාර්ය බලය අනුවය වශයෙනි. මෙහි දී සමන්තභද්‍ර බෝසතුන්ගේ ලෝකෝත්තර බලයත්, සෘධිප්‍රාතිහාර්ය බලයත් ගම්‍යමාන ය. සියලු කරුණු විමර්ශනයේ දී සමන්තභද්‍ර බෝසතාණන් වහන්සේ මහායානයෙහි නිරූපිතව ඇත්තේ සත්ත්වයාගේ ආරක්ෂකයකු වශයෙනි. එසේ වුව ද, පිතෘත්වය අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන අයුරු මෙහි දී ප්‍රකට ය.

**මඤ්ජු ශ්‍රී බෝසත් වරයාණෝ**

| | | |
|---|---|---|
| මුද්‍රාව | - | ධර්ම චක්‍ර |
| සංකේතය | - | ඛංගය හෝ පුස්තකය |
| වර්ණය | - | සුදු, රතු හෝ කළු |
| වාහනය | - | සිංහයා |
| ශක්ති | - | සරස්වතී |

මඤ්ජු ශ්‍රී බෝසතුන් ප්‍රථම බෝධිසත්ත්වවරයා වශයෙන් පිළිගැනේ. සියලු බෝසතුන් බුදුබව පිණිස පුරුදු කරන බැවින් ආදි බුද්ධ නමින් ද හැඳින් වේ. එසේ ම **මඤ්ජුඝෝෂ, මහාරාජ ලීලා, සාධන, වජ්‍රනාග, මඤ්ජුවජ්‍ර, කුමාරවාජීශ්වර, කුමාරභූතාදී** පර්යාය නාම රාශියකින් ද හැඳින් වෙයි.

ගෞතම බුදුරජාණන් වහන්සේගේ නළලින් නික්මුණු රශ්මි ධාරාවක් දඹගසට වැදී එහි හටගත් මලකින් මඤ්ජු ශ්‍රී බෝසතුන්ගේ උත්පත්තිය සිදු වී යැයි මහායාන ග්‍රන්ථවල දක්නට ඇත. එමෙන් ම ඇතැම් නූතන විචාරකයන්ගේ මතය නම් මෙතුමා උත්තර භාරතයේ ධර්මදූත මෙහෙවරේ යෙදුණු ධර්ම දූතයකු බවයි (Bodhisattva Doctriue P. 28). එසේ ම මෙතුමා සත්ත්වයන්ගේ අරක්ෂකයා ලෙස නිරූපිත ය. මහායානයෙහි මෙතුමාට දැඩි ලෙස පිතෘ සංකල්පයක් ආරෝපණය වී ඇති බවක් දක්නට නොලැබේ. හින්දු දහමේ විෂ්ණු දෙවියන්ට හිමි වී ඇති ස්ථානය මහායාන බුදු දහමේ දී මඤ්ජු ශ්‍රී බෝසත්වරයාට ලැබී ඇතැයි කිව හැකි ය. එහෙත් සද්ධර්මපුණ්ඩරීකයේ දී මඤ්ජු ශ්‍රී බෝසත්වරයාගේ ලෝක පිතෘත්වය මදින් මද ප්‍රකට වන අවස්ථා ගණනාවක් හඳුනා ගත හැකි ය "**බුද්ධ පුත්‍ර මඤ්ජු ශ්‍රී, මේ සභාවේ කුතුහලය සැකය දුරුකරන ලෙස ඔබට ආයාචනය කරන්නෙමු**'' (Bukkyo Dendo Kyokai,2008, P.02). බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙන් නිකුත්වන ආලෝක ධාරාවන් පිළිබඳව විමර්ශනය කිරීමට යොදාගනු ලබන්නේ මඤ්ජු ශ්‍රී බෝසත්වරයා ය "**භගවතො මහානිමිත්තං ප්‍රතිහාර්යාවභාසංදෘෂ්ට්වා ආශ්චර්ය ප්‍රාප්තානාම භූතප්‍රාප්තානාං කෞතුහලප්‍රාප්තනාමෙතද්භවත් කිං නු ඛලු වයම්ව මෙවරූපං භගවතො මහද්හිර්ප්‍රාතිහාර්යාව භාසං කෘතං පරිපුච්ඡේම**'' (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 8 පරි). මෙසේ මඤ්ජු ශ්‍රී බෝසත් වරයාගෙන් බුදුරජාණන් වහන්සේගේ රශ්මි

කදම්බයන් පිළිබඳ විචාරීමෙන් හා එහි දී එතුමා ඊට දෙන පිළිතුරෙන් ද ගම්‍යවන්නේ පිතෘත්වයේ ලක්ෂණයකි. **මඤ්ජු ශ්‍රී, සතර ශ්‍රාවයන්, මකර, නාග, අසුරයන් ඔබ දෙස බලා සිටින්නේ ඔබ දෙන පිළිතුර කුමක් ද, යන්න දැන ගැනීමට ය** (Bukkyo Dendo Kyokai, 2008, P.04).

මෙවැනි ප්‍රකාශයකින් වුව ද ලෝක පිතෘත්වය මඤ්ජු ශ්‍රී බෝසත් චරිතයෙන් ඉස්මතු වන ආකාරය පෙනේ. මේ හැරුණු කොට ශාක්‍යමුනි බුදුරජාණන් වහන්සේ ප්‍රඥාකූඨ බෝධිසත්වයන්ට විටෙක කරන ලද ප්‍රකාශයකින් ද මඤ්ජු ශ්‍රී බෝසතුන්ගේ පිතෘත්වය ප්‍රකට ය ''**කුල පුත්‍රය, මොහොතකට නවතින්න. ඔබ මඤ්ජු ශ්‍රී බෝධිසත්වයන් දැකිය යුතු ය. ඔහුත් සමග සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය ගැන සාකච්ඡා කළ යුතු ය. ඉන් ඔබගේ බුද්ධ ක්ෂේත්‍රය බලා යා හැකි ය**'' (Bukkyo Dendo Kyokai, 2008, 19 Chap).

ප්‍රඥාකූඨ බෝධිසත්ත්වයන් සමග මඤ්ජු ශ්‍රී බෝසතුන් එම සාකච්ඡාව කරන විට වැඩ සිටින්නේ රථ රෝදයක් හා සමාන දහසක් පෙති ඇති නෙළුම් මලක් මත ය. මෙකී තත්ත්වය සැබවින් ම මඤ්ජු ශ්‍රී බෝසතුන්ගේ සර්වේශ්වරත්වය ප්‍රකට වන අවස්ථාවකි. මඤ්ජු ශ්‍රී බෝසතුන්ගෙන් ප්‍රඥාකූඨ බෝධිසත්ත්වයන් අසන්නේ මඤ්ජු ශ්‍රී බෝසතුනි, නාරජුගේ මාලිගාවට ගිය ගමනේ දී කොපමණ සත්ත්වයන් පිරිසක් ධර්මයේ සමාදන් කරවූයේ ද? (Bukkyo Dendo Kyokai, 2008, 19 Chap) යනුවෙනි. එහි දී මඤ්ජු ශ්‍රී බෝසතුන් පිළිවදන් දෙනුයේ මෙලෙස ය. ''**මට එහි සංඛ්‍යාව ප්‍රමාණය කළ නොහැක. ගණන් කොට අවසන් කළ නොහැක. මුවකින් එය ප්‍රකාශ කළ නොහැකි තරම් ය. මානයකින් එය මැනිය නොහැකි ය. මොහොතක් සිටිනු මැනව, එය ඔප්පු කිරීමේ සාධක මට පෙන්විය හැකි ය**'' (Bukkyo Dendo Kyokai, 2008,19 Chap).

පිළිවදන් දීම අවසන් වීමටත් ප්‍රථම නෙළුම් මල් මත වැඩසිටිමින් මහසාගරයෙන් නික්මුණු අසංඛ්‍ය අප්‍රමාණ බෝසත්වරුන් ගිජුකුළු පර්වතයට පැමිණ අහසේ වැඩ සිටිය අතර මේ සියලු බෝසත්වරුන් මඤ්ජු ශ්‍රී බෝසතුන් වහන්සේ විසින් ධර්මයෙහි පිහිටුවා විමුක්ති මාර්ගයට පැමිණ වූ පිරිස් ලෙස පැහැදිලි කෙරෙයි. මේ නයින් හඳුනාගත හැකි වන්නේ සර්වව්‍යාපි වූ සර්වේශ්වර වූ ස්වරූපයක් ඇති මඤ්ජු ශ්‍රී බෝසතුන් ලෝක සත්ත්වයාගේ පියකු වශයෙන් හැඳින්වීමට තරම් සාධක සොයාගත හැකි බවයි.

මඤ්ජු ශ්‍රී බෝසතුන්ගේ ගුණ වර්ණනා කරමින් නිර්වාණාවබෝධය නැතහොත් බෝධිඥානය පිණිස කටයුතු කරන මෙන් කරන ප්‍රකාශය යාඥාවක් ලෙස නිරූපිත ය. මෙම බෝසතුන් බුදුරජාණන් වහන්සේගේ ධර්මය දේශනා කරන බුද්ධ පුත්‍රයා ලෙස ප්‍රකට වන අතර ම අනෙක් අතින් සත්ත්වයා දුකින් මුදවා ගන්නා ලෝක පිතෘවරයෙක් වශයෙන් ද නිරූපිත ය. එක් අවස්ථාවක මෛත්‍රේයනාථ බෝසතුන් විසින් නගන ප්‍රශ්නවලට ලබාදුන් පිළිතුරුවලින් ද මඤ්ජු ශ්‍රී බෝධිසත්වයන්ගේ ලෝක පිතෘත්වය ප්‍රකට වෙයි ''**මහාධර්මශ්‍රවණ සාංකථ්‍යාමිදං කුලපුත්‍රා සත්ථාගතස්‍ය කතෘමභිප්‍රායඃල**

**මහාධර්ම වෘෂ්ටව්‍යභිනුවර්ෂණංච මහාධර්මදුන්දුභිසංනුවාදනං ච යථා මම කුල පුත්‍රාඃ ප්‍රතිභාසතිල යථා ච මයා පූර්වකාණංතථාගතානමහර්තාං සම්‍යක්සමුද්ධංනාම්දමෙවරූපං පූර්ව නිමිත්තං දෘෂ්ටමහුත්...** (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 21 පිටුව).

මේ ආකාරයෙන් තථාගතයන් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් හා රශ්මිකදම්භයන් නිකුත් වන්නේ සද්ධර්මපුණ්ඩරීකය දේශනා කිරීමට ආසන්න වූ බව ගම්‍ය කරමින් බව ප්‍රකට කෙරෙන දීර්ඝ විස්තරය යථොක්ත කරුණ මනාව ප්‍රකට කරන්නකි. ''**මඤ්ජු ශ්‍රී බෝසතුන් වහන්ස, මහාප්‍රඥාවෙන් සීල ගුණයෙන් හෙබි අභීත මහාසත්වරයකු වූ ඔබ අප්‍රමාණ සත්ත්ව සමූහයක් ධර්මයේ සමාදන් කරවා විමුක්තියට පත්කරන ලද්දේ වෙයි. දැන් මා මේ සභාවේ සිටින අන් සියල්ලන් ද ඒ සියලු දෙනා දක්නා ලදි. පරම සත්‍ය මූලධර්මය දේශනා කරන්න. එක ම යානයක් පිළිබඳ දොරටු විවෘත කරන්න. බොහෝ සත්ත්වයන්ට පුළුල්ව මාර්ගෝපදේශය දක්වන්න** (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 22 පිටුව). මෙලෙස සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ දී ප්‍රඥාකූඨ බෝධිසත්ත්වයන් මඤ්ජු ශ්‍රී බෝසතුන්ව වර්ණනා කරන ආකාරයත්, පරම සත්‍යය දේශනා කරන්නයැ'යි කරන ආරාධනාවත් මඤ්ජු ශ්‍රී බෝසතුන්ගේ ලෝක පිතෘත්වයට සාධකයෝ ය ''**මහසයුරේ වසන අතරතුර දී මා විසින් දේශනා කරනු ලැබුවේ සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය පමණක් ම ය**'' (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 22 පිටුව). මෙසේ මඤ්ජු ශ්‍රී බෝසතුන් ම කරන ප්‍රකාශයෙන් ගම්‍ය වන්නේ මහාසාගරය තමන් වහන්සේගේ වාසස්ථානය වන බවයි. මහායානයෙහි දක්නට ලැබෙන දේවත්වාරෝපණය ඉතා දෘඪව යෙදුණු තැනක් සේ මෙකී අවස්ථාව හඳුනා ගත හැකි ය. මෙය ද මඤ්ජු ශ්‍රී බෝසතුන්ගේ ලෝක පිතෘත්වයට සාධකයකි. මේ අනුව විද්‍යමාන ස්වරූපය වන්නේ ආරම්භයේ දී සත්ත්වයාගේ ආරක්ෂකයා වූ මෙතුමාට කල්යත් ම ලෝක පිතෘවරයකු බවට පරිවර්තනය වීමෙහිලා අවශ්‍ය කරුණු සම්පූර්ණ වූ බව ය.

**අවලෝකිතේශ්වර බෝසත්වරයාණෝ**

| | | |
|---|---|---|
| මුද්‍රාව | - | නමස්කාර |
| සංකේතය | - | අක්ෂමාලාව හා පද්මය |
| වර්ණය | - | ශ්වේත |
| භාර්යාව | - | තාරා |
| මන්ත්‍රය | - | ඕම්, මණි පද්මේ හූම්! |
| වජ්‍රමන්ත්‍රය | - | හ්‍රී |
| ධ්‍යානී බුද්ධ | - | අමිතාභ |
| ධ්‍යානී බෝධිසත්ත්ව | - | අවලොකිතේශ්වර |
| මානුෂී බුද්ධ | - | ශාක්‍යමුනි |

අවලෝකිතේශ්වර බෝසතුන්ගේ පිතෘත්වය සුවිශේෂීත්වයකින් ඉදිරිපත් කරන අයුරු මහායානය පුරා ම දක්නට ලැබේ. යථෝක්ත බෝසත්වරුන්ට වඩා ලෝක

පිතෘත්වය සෘජුව ම ආරෝපණය කරන ලද්දේ අවලෝකිතේශ්වර බෝසතුන්ට ය. කල්පද්‍රෘම අවදාන මාලාවෙහි මාත්සර්ය චාරිත්‍රාවදානයේ මෞද්ගල්‍යාන හිමියෝ දකින්නේ දුකින් දැවෙන පුද්ගලයාගේ දුක ඉවත් කිරීමේ ශක්තිය ඇත්තේ අවලෝකිතේශ්වර බෝසතුන්ට පමණක් බව ය. එහි දී මෞද්ගල්‍යාන හිමි බුදුරජාණන් වහන්සේගෙන් අසන ප්‍රශ්නයකට දෙන ලද පිළිතුර මෙසේ ය. "**ඉති උක්තේ තෙන සිස්සේන ස සර්වජ්ඥෝබ්‍රවීත් පුනඃ........**" "**තතෝ රතනත්‍රයම් ස්මර්ත්වා සරණම්ච ප්‍ර යාස්‍යති.........................**" (Kalpadruma. 1998, 113p). මහායානයෙහි දී ගැලවුම්කාරී බව බුදුරජාණන් වහන්සේට ආරෝපිත වූවකි. මෙකී තත්ත්වය අවලෝකිතේශ්වර බෝසතුන්ට ද පැවරී ඇත. නරක ක්‍රියා කරන ලද ප්‍රේතියක් ජීවිත පන්සියයක් මුලුල්ලේ ම දුක් විඳී. අවලෝකිතේශ්වරනාථ බෝසතුන් ඉන්පසුව ඇයට පිහිට වෙයි. එමෙන් ම බොහෝ සැලකිල්ලෙන් කරුණා ධාරාව පතුරවන බව ද පැහැදිලි කෙරේ. එතුමා ඇයව දුකෙන් මුදවන අතර තුනුරුවන් ගැන පහදවා ධර්මය දේශනා කර අවසානයේ දී සුඛාවති බුද්ධ රාජ්‍යට යවන බව ද පැහැදිලි කෙරේ (Kalpadruma, 1998, 14 Chap 179 -183). සත්ත්වයාට ධර්මාවබෝධය ලබා දී අවසානයේ දී සුඛාවතී බුද්ධරාජ්‍යයට මෙහෙයවන බව සමාධි රාජ සූත්‍රයේ ද විස්තර වෙයි. මහායානයේ නොයෙක් තැන්වල මෙතුමා නිරූපණය වන්නේ සත්ත්වයන් දුකෙන් ගලවා සුඛාවති බුද්ධරාජ්‍යයට යවන දේව නියෝජිතයා වශයෙනි.

කල්පද්‍රෘම අවදානමාලාවේ ස්ථවිරක අවදානයෙහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ ආනුභාවයෙන් ස්ථවිරක තෙරුන් වහන්සේව වේදනාවලින් නිදහස් කිරීමට සමත් වූ බව ය (Kalpadruma, 1998, 19 Chap. 139 - 149). මෙවැනි අවස්ථා ගණනාවක් ම කල්පද්‍රෘම අවදානමාලා වෙහි දක්නට ලැබේ. විශේෂයෙන් මහායානය පුරා ම සුවිශේෂී බෝධිසත්වවරයෙක් වශයෙන් අවලෝකිතේශ්වර බෝසතුන් ඉස්මතු වන බව දක්නට ලැබීම සුලභ ය. පෞද්ගලිකව ම සත්ත්වයන් බෝධිසත්ත්ව ප්‍රතිපදාවට යොමුකිරීමට අවලෝකිතේශ්වරයන්ට හැකියාවක් ඇත. එමෙන් ම එයට අවලෝකිතේශ්වරනාථ බෝසතුන්ගෙන් උපෝසථ වරයක් ලබා ගැනීම, එය පුරුදු කිරීම හා පිළිපැදීම කළයුතු බව දැක්වේ. එයට හොඳ ම නිදසුනක් ලෙස කල්පද්‍රෘම අවදානමාලාවේ ශ්‍රීමතී කථාව හඳුනාගත හැකි ය. ඒ අනුව මෙතුමා සත්ත්වයන්ට බෝධිසත්ත්ව චර්යාව ප්‍රදානය කරන්නා ලෙස ද නිරූපිත ය. එමෙන් ම අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් සියලු ම බෝසත්වරුන්ගේ ප්‍රධානියා වශයෙන් හඳුන්වා ඇති අයුරු ද කල්පද්‍රෘම අවදානමාලාවේ දී දැකිය හැකි ය.

මහායාන සූත්‍ර ගණනාවක ම අවලෝකිතේශ්වරනාථ බෝධිසත්වයාණන් ලෝක පියකු වශයෙන් නිරූපණය කර ඇතත් මෙහි දී වැඩි අවධානයක් යොමු කරනුයේ සද්ධර්මපුණ්ඩරීකයේ දී මෙතුමාගේ පිතෘත්වය කෙසේ දැ'යි සොයා බැලීමට ය. අවලෝකිතේශ්වර යන වචනයෙන් මෙම බෝසතුන් හඳුන්වනු ලබන්නේ කුමක් නිසාදැයි අක්ෂයමතී නම් බෝසත්වරයාට සද්ධර්මපුණ්ඩරීකයේ දී දේශනා කරන විස්තරයක දී පැහැදිලි කෙරෙයි. බුදුරජාණන් වහන්සේ හා අක්ෂයමතී බෝසතාණන්

වහන්සේ අතර වූ සාකච්ඡාව උක්ත කාරණය සම්බන්ධයෙන් වැදගත් වේ. මෙහි දී බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කරති. ''ගණන් කළ නොහැකි සිය දහස් ගණන් සත්ත්වයන් නොයෙක් දුක් වේදනා විඳිමින් පීඩාවන්ට භාජනය වන්නේ යැ'යි සිතන්න. නොයෙක් වද වේදනාවන්ට භාජනය වන්නේ යැ'යි සිතන්න. එසේ වූ විට ඔවුන්ට අවලෝකිතේශ්වර බෝසතුන්ගේ නම අසන්නට ලැබී එක ම මනසකින් අවලෝකිතේශ්වර යැ'යි ආමන්ත්‍රනය කරන කල්හි එය ඔහුට ඇසීමෙන් සියලු දුක් වේදනාවලින් මුදවන්නේ ය'' (Bukkyo Dendo Kyokai, 2008, 233p). මෙතුමාගේ නාමයෙන් සමස්ත විශ්වය ම අවලෝකනය කරන ප්‍රධානියා යන්න ද අර්ථ ගන්වා ඇත. අන් සියලු බෝසත්වරුන්ගේ ශක්තීන් අභිභවා පිතෘ සංකල්පය ඉස්මතු වී පෙනෙන බෝසත් වරයෙක් ලෙස හඳුනා ගත හැකි වන්නේ මොහු ය. මෙතුමාගේ නානා අවතාරයෝ ද වෙති.

එහිදී තැනක අත් සතරකි, තවත් තැනක අත් දහයකි, අන් තැනක හිස් තුනක්, ඇස් තුනක්, අත් සතරක් ද වෙයි. තව තැනක හිස් පහක් ද ඇස් තුනක් ද අත් සූවිස්සක් ද වෙයි. අත් දහසකින් යුත් අවතාරයක් ද අවලෝකිතේශ්වරට ඇත්තේ ය. එහි දී කඩුවක් සහ පළිහක් දැරූ දෑතක් හිස උඩ වෙයි. ඉදිරියෙහි නාගයකුගේ දරන වැළකී (ලක්දිව මහයාන අදහස්, 1978, 203 පිට). මෙහි නිරූපණය වන ආකාරයට අවලෝකිතේශ්වර බෝසතුන් වනාහි සර්වේශ්වර පෞරුෂයකින් වර්ණිත සුවිශේෂී බෝධි සත්ත්වයන් වශයෙන් මහායානයෙහි විවරණය වෙයි.

අමිතාභ බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවකයා ලෙස මෙතුමා හැඳින්වෙන අතර නුවණට අධිපති ද වේ. කාරණ්ඩව්‍යූහ සූත්‍රයේ මෙතුමා පිළිබඳ පුළුල් විස්තරයක් දක්නට ලැබෙන (ලක්දිව මහයාන අදහස්, 1999, 231 පිට) අතර එයට අනුව අවලෝකිතේශ්වර බෝසතුන් ලෝක සත්ත්වයාගේ ගැලවුම් කරුවෙකි. එමෙන් ම අවලෝකිතේශ්වර බෝසතුන් මැවුණේ ආදි බුදුරජාණන් වහන්සේගේ ආත්මයෙන් බව ද ප්‍රකට ය. භෞතික වස්තූන් නිර්මාණය කරන ලද්දේ ද මොහු විසිනි. හෙතෙම සිය දෙ ඇසින් ඉර-හඳ දෙක ද, නළලින් ශිව දෙවියා ද, උරහිසින් බ්‍රහ්මයා ද, පපුවෙන් විෂ්ණු දෙවියා ද, දතින් සරස්වති දේවිය ද, මුවින් සුළඟ ද, දෙපයින් පෘථිවිය ද වශයෙන් විශ්වය මැවූහ. ලෝකකාරණ්ඩව්‍යූහ සූත්‍රයේ දී සත්වයාගේ පියා ලෙස ද මොහු නිරූපිත ය. මෙහි දී අපේක්ෂා කරනුයේ සද්ධර්මපුණ්ඩරික සූත්‍රයෙන් නිරූපණය වන එතුමාගේ ලෝක පිතෘත්වය ප්‍රකට කිරීම බැවින් උක්ත සූත්‍රය කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකෙරෙයි.

අවලෝකිතේශ්වර බෝසතුන් පිළිබද පූර්ණ විස්තරයක් සද්ධර්මපුණ්ඩරික සූත්‍රයේ 24 වෙනි පරිච්ඡේදයේ සමන්තමුඛ පරිවර්තයේ දී දක්නට ලැබේ. එම විස්තරයට අනුව ලෝක පියකු වශයෙන් බෝසතුන් නිරූපණය වීමක් දෘශ්‍යමාන ය ''**ඉහ කුලපුත්‍ර යාවන්ති සත්ත්ව කෝටිනයුතශතසහස්‍රාණි යානි දුක්ඛනි ප්‍රත්‍යනුභවන්ති තානි සචේද් අවලෝකිතේශ්වරස්‍ය බෝධිසත්වස්‍ය මහාසත්වස්‍ය නාමධෙයං ශෘණුයුථල තේ සර්වේ තස්මාද්දුඃ ස්වරසකන්ධාද් පරිමුච්‍යෙරන්**'' (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 540 පිට). සත්ත්වයෝ නොයෙක් දුක් වේදනා විඳිමින් පීඩාවන්ට

භාජනය වන්නේ ද එසේ වූ විටෙක අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ නම අසන්නට ලැබීමෙන් ම එම බෝධිසත්ත්වයන් විසින් දුක්බිත තත්ත්වයෙන් මුදවන බව පැහැදිලි කිරීමක් යථෝක්ත උද්ධෘතයෙන් ප්‍රකාශිත ය. මෙමගින් ගම්‍ය වන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් වනාහි සියලු සත්ත්වයන් දුක් වේදනාවලින් මුදවන පියකු බව ය. මෙවැනි සිදුවීම් ගණනාවක් ම අපට සද්ධමර්මපුණ්ඩරීකයේ දී හඳුනාගන්නට ලැබේ ''**යේ ච කුලපුත්‍ර සත්වා අවලෝකිතේශ්වරස්‍ය බෝධිසත්වස්‍ය මහාසත්වස්‍ය නාමධෙයං ධාරිෂ්‍යන්ති. සචෙතේ මහත්‍යාග්නිස්කන්ධෙ ප්‍රපතෙයුඃල සර්වෙතේ අවලෝකිතේශ්වරස්‍ය බෝධිසත්වස්‍ය මහාසත්වස්‍ය තේජසා තස්මානමහතොග්නිස්කන්ධාත් පරමුච්‍යෙතේ** (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 540 පිටුව).

යමෙක් අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ නාමය ධාරණය කරගෙන සිටින්නේ නම් ඔහු ගිනි ජාලාවකට මැදි වූයේ නමුදු බෝසතුන්ගේ සෘද්ධිප්‍රාතිහාර්ය බලය නිසා නොදැවෙන බව දක්වෙයි ''**සචෙත් පුනඃ කුලපුත්‍ර සත්වා නදිභිරුහ්‍යමානා අවලෝකිතේශ්වරස්‍ය බෝධිසත්වස්‍ය මහාසත්වස්‍යාක්‍රන්දං කුර්යුඃල සර්වාස්තා නද්‍යස්තේෂාං සත්වානං ගාධං දද්‍යුඃග සචේත් පුනඃ කුලපුත්‍ර සාගරමධ්‍යෙ වහනාභිරූඪානාං සත්වකොටිනයුත ශතසහස්‍රාණං හිරණ්‍ය සුවර්ණමණිමුක්තාවජ්‍රවෛඩූර්ය ශඞ්ඛ ශිලා ප්‍රවාලාශ්ම ගර්භ මුසාර ගල්වලෝහිත මුක්තාදීනාං කෘතානි ධීනාං ස පොතස්තෙෂාං කාලිකාවාතේන රාක්ෂසිද්ධිපේ ක්ෂිපතඃස්‍යාත්ල තස්මිංශ් ච කශ්චිදෙවෛකඃ සත්වඃස්‍යාත් යො'වලෝකිතේශ්වරස්‍ය බොධිසත්වස්‍ය මහාසත්වස්‍යාක්‍රන්දං කුර්යාත් සර්වං තේ** '' (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, පරි. 24).

උක්ත උද්ධෘතයෙන් විස්තර වන්නේ යම් පුද්ගලයෙක් සැඩ වතුරකට හසු වී ගසාගෙන යන විට අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ නාමය හඬනගා කියූ සැනින් ම ඔහු ගොඩබිමට පැමිණෙන බව ය. එමෙන් ම සියදහස් ගණන් සත්ත්වයන් රන්, රිදී, මුතු මැණික්, සක්, පබලු ආදි වටිනා දේ පුරවාගත් නෞකාවක නැඟී යන අතර මග දී සැඩ සුළඟක් පැමිණ රාක්ෂසයන්ගේ දිවයිනට ගසාගෙන යයි ද එවිට නැවේ සිටි එකකු විසින් හෝ 'අවලෝකිතේශ්වර' යන නම කියනු ලබන්නේ ද එවේලේ ම එම පිරිස රාක්ෂස උවදුරුවලින් මිදෙන බව ය. මෙසේ මේ සියලු කරුණුවලින් පැහැදිලි වන්නේ සර්වේශ්වර ලෝක පිතෘවරයකුගේ ස්වරූපයකින් අවලෝකිතෙශ්වර බෝසතුන් නිරූපණය වන අයුරු ය. එකී ලෝක පිතෘත්වය නිසා ම අවලෝකිතේශ්වර යන නමින් හඳුන්වන බව ද සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ ම "**අනේන බලු පුනක් කුලපුත්‍ර කාරණෙන අවලෝකිතේශ්වරොබෝධිසත්වෝ මහාසත්වෝ අවලෝකිතේශ්වර ඉති සංඥායතේ** "යන්නෙන් පැහැදිලි කෙරෙයි (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, පරිඃ 24).

''**සචේත් කුලපුත්‍ර කශ්චිදේව වධ්‍යොතසෘෂ්ටොවලෝකිතේශ්වරස්‍ය බෝධිසත්වස්‍ය මහාසත්වස්‍යා ක්‍රන්දං කුර්‍යාත්ල තානි තේෂාං වධ්‍යඝාතකානං ශස්ත්‍රාණි විකීර්යන් සචේත් බලු පුත්‍ර කුලපුත්‍ර අයං ත්‍රිසහස්‍ර භාසාහස්‍රො ලොකධාතුර්‍යී**

**ක්‍ෂරාක්‍ෂසෞථ පරිපූර්ණා භවේත්ල තේවලෝකිතේශ්වරස්‍ය මහාසත්වස්‍ය මාහාසත්වස්‍ය නාමධෙය ප්‍රහණෙන........ සත්ත්වා දාවාර්සෙමභීඩිනිගඩබන්ධනෛඞී බද්ධො භවේත්ල අපරාධ්‍යනපරාධී වාල තස්‍යාවලෝකිතේ-ශ්වරස්‍ය බෝධිසත්වස්‍ය මහාසත්වස්‍ය නාමධෙය-ග්‍රහණේන ක්‍ෂිප්‍රං තානි''** (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, පරි. 24). මෙයින් අර්ථවත් වන්නේ යම්කිසි පුද්ගලයකු තර්ජනාත්මකව කඩු කිණිසිවලින් පහර කෑමකට ලක්වන්නේ නම් එවේලේ හෙතෙම අවලෝකිතේශ්වර බෝසතුන්ගේ නම සිහි කිරීම කළයුතු අතර එවිට කඩු, කිණිසි බිඳී ගොස් පහර දෙන්නට ආ පුද්ගලයා වෙව්ලීමට පටන් ගන්නා බවයි. එමෙන් ම යක්‍ෂ රාක්‍ෂාදීන් හිරිහැර කෙරේ නම් එවිට අවලෝකිතේශ්වරයාණන් ගැන සිහිපත් කෙරෙයි ද, එවිට එම රාක්‍ෂයන් එම පුද්ගලයාට හිරිහැර කරනු හෝ ඔහු දෙස බැලීමටවත් උත්සාහ නොකරති. එසේ ම නිරවද්‍යව හෝ සාවද්‍යව යමෙක්ව යදම්වලින් බැඳ දමා හිරිහැර කර ඇත්නම් එවිට ඔහු විසින් අවලෝකිතෙශ්වර බෝසතුන් සිහිපත් කෙරෙයි ද එවිට සියලු යදම්වලින් මිදෙන බව ද දැක්වෙයි.

මේ ආදි වශයෙන් විවිධ වූ ප්‍රාතිහාර්ය හා සෲද්ධීන් පිළිබඳ විග්‍රහයෙන් නිරූපණය වන්නේ මෙම බෝසතුන් වනාහී ලෝක පිතෘවරයකු ලෙස ඉදිරිපත් වන බවයි. අතිශයෝක්ති ලෙස හෝ අතිමානුෂිකත්වයකින් හෝ නිරූපණය වන සුවිශේෂී කාරණය වන්නේ ලෝක පිතෘත්වය බව මෙහි දී තව දුරටත් සාධනය වන කරුණු බොහෝමයක් විද්‍යමානව පවතියි. බුදුරජාණන් වහන්සේ අක්‍ෂමතිය බෝසතුන්ගෙන් අසන ප්‍රශ්න ද එහිදී විශේෂ වෙයි **"යශ්ච කුලපුත්‍ර..... යශ්චද්වාෂෂ්ටීනාං ගඞ්ගානදීවාලිකාසමානාං බුද්ධානං භගවතාං නමස්කාරං කුර්‍යාත්ල නාමධෙයානි ධාරයෙත්ල යශ්ච තාවතාමෙව බුද්ධානං.............. ස කුලපුත්‍රෝවා කුලදෘහිතො වා තතෝනිදානං පුණ්‍යභිසංස්කාරං ප්‍රසවේත්,** (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 24 පරි, 544 පිටුව). අක්‍ෂමතිය, මිලියන හැටදෙකක් ගංගාවල වැලි සමාන බෝසතුන්ගේ නම් පිළිගෙන ඔවුන්ගේ නාම ධාරණය කරගෙන සිටින පුද්ගලයන් සිටින්නේ යැයි සිතන්න. ඔහුන්ගේ ජීවිතාන්තය දක්වා ම සිව්පසයෙන් සංග්‍රහ කරන්නේ ද ඔබගේ අදහස කුමක් ද? එම කුල පුත්‍රයා හෝ දියණිය බොහෝ ඵල ලබන්නේ ද? නොලබන්නේ ද? යනුවෙන් බුදුරජාණන් වහන්සේ නගන ප්‍රශ්නයට අක්‍ෂයමතී බෝසතුන් විසින් 'තථාගතයන් වහන්ස, නිසැකව ම බොහෝ මහත්ඵල ලබනු ඇත' යනුවෙන් පිළිවදන් දෙන ලදි.

බුදුරජාණන් වහන්සේ නැවතත් මෙසේ දේශනා කරති. **"යශ්ච කුලපුත්‍ර තාවතාං බුද්ධානං........ යශ්ච අවලෝකිතෙශ්වරස්‍ය...... ඒකම්පි නමස්කාරං කුර්‍යාත් නාමධෙයං ච ධාරයේතල් සමෝනයිකොඳුනති. රේකථ පුණ්‍යාභිසංස්කාරථ උභයතො භවේත් යශ්වතේෂාං ද්වාෂෂ්ටිනාං ගඞ්ගානදීලිකාසමානාං බුද්ධානං........ එතාවෘභෞ පුණ්‍යස්කන්ධෞ න සුකරෞ ක්‍ෂපයිතුං කල්පකෝටිනයුත ශතසහ සෞරපි........**(සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 24 පරි, 544 පිටුව). මේ සංවාදයෙන් පැහැදිලි වන්නේ යම් කිසි පුද්ගලයකු අවලෝකිතෙශ්වර බෝධිසත්ත්වයන් පිළිගෙන, දරාගෙන එක වතාවක් හෝ නමස්කාර කරන්නේ නම් එවිට ඔහු හා බෝසතුන්

විශාල සංඛ්‍යාවකට ජීවිත කාලය පුරා ම දානෝපාහාර දක්වන ලද පුද්ගලයෙක් අතර වෙනසක් නොපවතින බවයි. එහි දී ලැබෙන පුණ්‍ය ශක්තිය අසංඛ්‍යය, අප්‍රමාණය, සීමාවකින් තොර ය. මෙහි දී මෙසේ විග්‍රහ වන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ පරමත්වයයි. මෙතුමා සියලු බෝසතුන් අභිභවා පරම බෝසත්වරයාණන් ලෙස මහායානයේ දී පිළිගැනෙන බව ද එමගින් තවදුරටත් ප්‍රකට ය. මෙසේ සද්ධර්මපුණ්ඩරීකයේ දී නොයෙක් අවස්ථාවන්වල දී අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් නිරූපණය වී ඇත්තේ ලෝක පිතෘවරයෙක් වශයෙන් බවට විවාදයක් නැත. අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ එක ම අභිප්‍රාය ලෝක සත්ත්වයන් දුකින් ගලවාගැනීම බව මෙහි දී පැහැදිලි ය. කල්පද්‍රුම අවදානමාලාවේ නොයෙක් මාර්ගයෙන් සත්ත්වයාට උපකාර කරන බව මෙසේ දැක්වේ. ''**සන්තස්තු ත්‍රිභවෙලොකේ බෝධිචර්යානුසාධිනහ් තෙසාම් නාථා මහාසත්වා බෝධිසත්වා ජිහාත්ම ජාහ**'' (Kalpadruma, 1998, 20 Cha - 379 Vs., Edited by Dr. Vigeshinya).

එතුමා විටෙක බුද්ධ ස්වරූපය ද, විටෙක බෝධිසත්ත්ව ස්වරූපය ද, විටෙක පසේ බුදු වරයකුගේ ස්වරූපය ද විටෙක ශ්‍රාවකයකුගේ ස්වරූපය ද ආදි වශයෙන් බ්‍රහ්ම, ශක්‍ර, වෛශ්‍රවණ, රජ, මිනිස්, ගෘහපති, ඇමති, බ්‍රාහ්මණ, ශ්‍රමණ, උපාසක, උපාසිකා, තරුණ ළමයෙක්, මකරෙක්, යකෙක්, ගාන්ධර්වයෙක්, අසුරයෙක්, එමෙන් ම ගරුඬ, කින්නර, මහෝරගාදී ඕනෑ ම ස්වරූපයකින් පෙනී සිට සත්ත්වයන් දුකින් ගලවා ගැනීමට උත්සාහ ගන්නා බව පැහැදිලි කෙරේ "**සති කුලපුත්‍ර...... බුද්ධරූපේන සත්‍වානං ධර්මං දේශයතිසන්තිලොකධාත්වථ ශේෂ්වලෝවතිතේශ්වරො බෝධිසත්වෝ මහාසත්වෝ බෝධිසත්වරූපේන**'' (සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය, 1978, 545 පිටුව).

මේ අනුව අවලෝකිතේශවරයාණෝ තම දරුවන් දුකින් ගැලීසිටින විට ඉන් ගලවා ගැනීම සඳහා තමාගේ ස්වරූපය වෙනස් කරමින් කටයුතු කරන අයුරු පෙනේ. දෙව්, මිනිස්, නාග, යක්ෂ, බ්‍රහ්මාදී සියලු සත්ත්ව කොට්ඨාසයන් අභිභවමින් ඔවුන්ගේ සුබ විහරණය සඳහා කටයුතු කරන බැවින් ද මෙම විස්තරයෙන් ප්‍රකට වන්නේ බෝධිසත්ත්වයන්ගේ ලෝක පිතෘත්වයයි. බුදුරජාණන් වහන්සේ විසින් තවදුරටත් දේශනා කරනු ලබන්නේ අවලෝකිතේශ්වර බෝසතුන් කෙරෙහි විශ්වාසය තබන ලෙස ය. ලෙඩ රෝග විපත් උවදුරු පීඩා, සිත්තැවුල් මේ ආදි කුමන දුකක දී වුව ද අවලෝකිතේශ්වර බෝසතුන් ගැන සිතන ලෙසත්, එතුමාගේ බලය ගැන සිතන ලෙසත්, එතුමාගේ ශක්තිය ගැනත් සිහිපත් කරන ලෙසටත් අවවාද කරති. එවිට ඒ සියල්ලෙන් ම ඔබ මුදවන බවත්, සැප ළඟා කරදෙන බවත්, මෙහි දී වැඩිදුරටත් දේශනා කරති. මෙලෙස අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයාණන් සතු ලෝකපිතෘත්වය සද්ධර්මපුණ්ඩරීකයේ බොහෝ කොට ව්‍යාප්ත වන අයුරු හඳුනාගත හැකි ය. මෙකී කාරණය සනාථ වන සුවිශේෂී තැනක් කල්පද්‍රුම අවදානමාලාවේ පෙනේ. ථේරවාදී ඉගැන්වීම්වලට අනුව යම්කිසිවකු ආනන්තර්ය පාපකර්ම කරන ලද්දේ ද ඔහුට විපාක දීමෙන් විනා එයින් නිදහස් වීමට නොහැකි ය. එනමුත් එහි දී එකී තත්ත්වය වෙනස් කිරීමේ හැකියාව අවලෝකිතේශ්වරනාථ බෝධිසත්වයන් සතුව ඇති බව පැවසෙන

අතර මෙකී තත්ත්වය අවලෝකිතේශ්වරනාථ බෝධිසත්ත්වයන්ගේ පීතෘත්වය ප්‍රකටව තීව්‍ර කරන්නකි.

අජාසත් රජු පිතෘ ඝාතකත්වයෙන් නිදහස් වීම සඳහා බුදුරජාණන් වහන්සේ හමුවීමට ගිය අතර එවිට බුදුරජාණන් වහන්සේ උපදෙස් දෙන්නේ අවලෝකිතේශ්වරනාථ බෝධිසත්ත්වයන්ගේ සරණාගතයෙක් වී උපෝසථව්‍රතය අනුග මනය කරන ලෙස ය. ඒ අනුව අජාසත් රජු අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ සරණාගතයෙක් වූ බව විස්තර කෙරේ (Kalpadruma.A.M – 20 Cha.- 385 Vs., Edited by Dr. Vigeshinya). අවලෝකිතේශ්වර බෝසතුන්ගේ ආනුභාවයෙන් දුකින් ගැලවී සුඛාවතී බුද්ධරාජ්‍යයට ගිය බව ද කල්පද්‍රෘම අවදානමාලාවේ මෙසේ දෘශ්‍යමාන ය ''**යත් නාම ස්මෘතිමාත්‍රේන සත්ත්වා නිරමුක්ත පාපකාන් සද්ධර්මගුණරත්නධ්‍යාඡ් සම්ප්‍රයන්ති සුඛාවතිම්**'' (Kalpadruma.A.M – 20 Cha-383 Vs. Edited by Dr. Vigeshinya). මෙකී කරුණු මගින් ගම්‍යමාන වන්නේ අවලෝකිතේශ්වරනාථ බෝධිසත්වයන් සත්ත්වයන්ගේ පව් කමාකරන පරම දෙවියා වූ බව ය. ලෝක පියකු වශයෙන් කරුණා ධාරාව තුන්ලෝකයේ ම පතුරවමින් වාසය කරන බව ය. එහි ම තවදුරටත් සඳහන් වනුයේ සකල සත්ත්වයන්ට නොයෙක් මාර්ග මගින් උදව් උපකාර සිදුකරන බව ය.

උක්ත සියලු නිදර්ශන මගින් සනාථ වන්නේ සෙසු ප්‍රධාන බොධිසත්ත්වයන් සත්දෙනා අභිභවා අවලෝකිතේශ්වරනාථ බෝධිසත්වයන්ගේ ලෝක පිතෘවය ඉස්මතු වන ආකාරයයි. එමෙන් ම විශ්වයේ සෑම තැනක් සඳහා ම දොරටුවල පෙනී සිටීම මෙතුමාගේ පිතෘත්වය ඉස්මතු වන හොඳම සාධකයකි. අවලෝකිතේශ්වර බෝධිසත්වයන් විසින් සත්ත්වයන් ආරක්ෂා කරන අතර සත්ත්වයා දුකින් මුදවා ධර්මාවබෝධය ලබා දී අවසානයේ දී සුඛාවතී බුද්ධරාජ්‍යට යොමු කරවන බව සද්ධර්‍ම පුණ්ඩරීකයේ මෙන් ම බොහෝ මහායාන සූත්‍රවල පිළිගැනීමයි. මෙකී තත්ත්වය අනෙක් සෙසු බෝධිසත්ත්වයන් කෙනකුට හෝ ආරෝපණය නොවීමෙන් ම ප්‍රකට වන්නේ අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ගේ පරමත්වය යැ'යි ද, ලෝක පිතෘත්වය යැයි ද හඳුනාගැනීම නිවැරදි ය.

හින්දු දර්ශනයෙහි දක්නට ලැබෙන ඊශ්වර (ශිව) දෙවියන්ගේ ස්වරූපය මහායානයේ දී අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්ට හිමි වී ඇති බව හඳුනාගත හැකි ය. ලෝක නිර්මාණය, පාලනය ආදී විශ්ව ක්‍රියාකාරී ධර්මතාවන්ට අධිපතිත්වයක් ඇති මෙම බෝසතුන් සර්වව්‍යාපී, සර්වතෝභද්‍ර ලෙස ද හුවා දැක්වෙයි. දසදහස් ගණනක් සියලු බෝධිසත්ත්වයන්ගේ ශක්තිය අභිභවනය කරමින් තුන්ලෝකවාසීන්ට පියකු වශයෙන් නිරූපණය වන අයුරු මහායාන ග්‍රන්ථ ඇසුරෙන් ප්‍රකාශිත ය. මෙලෙස බෝසත්වරුන් පිළිබඳ සුවිශේෂී වූ ආකල්පයකින් ලෝක පිතෘත්වය මහායාන සූත්‍රයන්හි දී ගොඩනැගී ඇති අයුරු හඳුනාගත හැකි ය.

ලෝකයේ බෝධිසත්වරුන් ලක්ෂගණනින් සමන්විත ය. සියලු ම බෝසත්වරු තථාගතයන්ගේ පුත්‍රයෝ වූහ. තථාගතයන්ගේ පුත්‍රයෝ දහම් දෙසන විට

සම්පූර්ණයෙන් ඉවසිලිවන්ත විය යුතු ය. කරුණාව, මෛත්‍රිය හා මෘදුභාවය සියලු සත්ත්වයා වෙත දැක්විය යුතු බවත් නොසැලකිල්ලට හා ආලස්‍ය මනසට ඉඩ නොදිය යුතු යැයි ද උපදෙස් දෙමින් ධර්ම දේශනා කළයුතු බව ද, බුදුරජාණන් වහන්සේ මහායාන සූත්‍රවල දී බෝසත්වරුන්ට දේශනා කරති. ඒ අනුව ධර්මය දේශනා කරන ධර්ම දූතයන් වශයෙන් බෝසත්වරුන් සත්ත්වයා හමුවට පැමිණෙන බව හඳුනා ගැනේ. මෛත්‍රෙයනාථ, අවලෝකිතේශ්වර, සමන්තභද්‍ර, මඤ්ජු ශ්‍රී වැනි බෝසත්වරුන් අනෙක් බෝසත්වරුන් අතුරින් වැදගත් වන්නේ ඔවුන් අසිරිමත් ලෝක පිතෘවරයකුගේ ස්වරූපයෙන් පිළිඹිබු වීම නිසා යැ'යි කල්පනා කළ හැකි ය. බුද්ධ කාර්යට සහාය වන්නන් වශයෙන් දක්වෙන එවැනි බෝසත්වරුන්ගේ කාර්‍ය්‍ය සාඵල්‍යය අර්ථග්‍රහණය කළ හැක්කේ ලෝක සත්ත්වයාගේ පියකු වශයෙන් බව පූර්වෝක්ත සර්වාකාර නිදර්ශනයන්ගෙන් ප්‍රඥායමාන කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*අංගුත්තරනිකාය අට්ඨකථා (මනෝරථපූරණී)*, 1925. සයිමන් හේවාවිතාරණමුද්‍රණය, කොළඹ.

*මජ්ඣිම නිකාය,* 1988, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, කොළඹ.

*වෛගේෂින්‍යා*, 1937, සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය (සංස්), දර්භංගා මිථිලා.

*වෛගේෂින්‍යා*, 1937, සමාධිරාජ සූත්‍රය (සංස්), දර්භංගා මිථිලා.

*වෛගේෂින්‍යා*, 1945, ශාලිස්තම්භ සූත්‍රය (සංස්), දර්භංගා මිථිලා.

*වෛගේෂින්‍යා*, 1935, ආර්ය ලංකාවතාර සූත්‍රය (සංස්), දර්භංගා මිථිලා.

*වෛගේෂින්‍යා*, 1950, ලලිත විස්තරය (සංස්), දර්භංගා මිථිලා.

*වෛගේෂින්‍යා*, 1942, ගණ්ඩවශ්‍යුහ සූත්‍රය (සංස්), දර්භංගා මිථිලා.

*වෛගේෂින්‍යා*, 1940 සුඛාවතී සූත්‍රය (සංස්), දර්භංගා මිථිලා.

*වෛගේෂින්‍යා*, 1937, අෂ්ටසාහශ්‍රිකා ප්‍රඥාපාරමිතා (සංස්), දර්භංගා මිථිලා.

*සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය*, 1978, බෞද්ධ ආකර ග්‍රන්ථ මාලා-1.

සාසානරතන හිමි එම්, 1975, *ලක්දිව මහයාන අදහස්.* රත්න පොත් ප්‍රකාශකයෝ.

Egerton, C. Baptist, 1953, *Nibbana or the Kingdom*? M. D. Gunasena Co. Ltd.

Bukkyo Dendo Kyokai, 2008, *THE LOTUS SUTRA*, New York.

Dr. Vigeshinya, 1998, *Kalpadruma*, Mithila.